කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පිළිපැදීමට මාධ්‍ය දිරිමත් කරනා නිර්දේශ මාලාවක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන්නට යෙදිණි.

"කොවිඩ්-19 ආසාදිත රෝගියෙකු මියගිය අවස්ථාවේදී විශේෂයෙන්ම ආදාහනය සිදු කරන දර්ශන පෙන්වීමේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම මගින් සහ ආදාහනය කිරීමට සූදානම් වන අවස්ථාවේදී එම මෘත ශරීරය බහාලූ පෙට්ටිය ආදාහනාගාරයට ඇතුලත් කර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පිරිස් ඇඳ සිටි ආරක්ෂිත කබා සහ අත්වැසුම් ආදිය ඉවත්කර ඒ තුලට දමන දර්ශන මගින් මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින්, එම තත්වය මග හරවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නම් දේහය සුසාන භූමිය වෙත රැගෙන එන දර්ශන පමණක් විකාශය කරන ලෙස ඉල්ලීම" යනුවෙන් එහි සඳහන් වේ.

මෙම නිර්දේශය ඇත්තේ කොවිඩ්-19 ආසාදනයෙන් මියගිය අයෙකුට සිදුවන යම් අගෞරවයක් වැළැක්වීම සහ ඒ ඔස්සේ මියගිය අයගේ සමීපතමයන්ට ඇති විය හැකි සිත් වේදනාවන් වැළැක්වීම සඳහා බව අවබෝධ කරගත හැකියි. එසේ නම්, එම මව්බිම පුවත (12/10) සමගින් අදාළ අයගේ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම ඔස්සේ ඉහත සඳහන් නිර්දේශය උල්ලංඝනය කෙරී තිබෙනවා නොවේද? සියලුම මාධ්‍ය මෙම නිර්දේශයන් පිළිපැදීම සඳහා ආචාර ධාර්මික වීම අත්‍යාවශ්‍ය වන්නේ නොවේද?

මූලාශ්‍ර: https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...

**#COVID19 #Media #lk #MediaEthicsSL #lka#SinhalaNews #Mawbima**